ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **මුදල් මණ්ඩලයේ ලේකම්** |
| දිනය | 2016.10.10 |

## මෑතදී පළවූ මාධ්‍ය වාර්තා පිළිබඳ මුදල් මණ්ඩල ප්‍රකාශනයයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලේ ප්‍රාථමික වෙළෙඳ ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලබන පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්හි පරීක්ෂණ වාර්තාව සඳහා පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරණයක් ලබා දී තිබුණි.

මෙම වාර්තාව මහජනතාව වෙත නිකුත් කර ඇත්තේ, නිසි අවසරයකින් තොරවයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව තවමත් එම වාර්තාව සම්බන්ධයෙන් වන අභ්‍යන්තර ක්‍රියාවලිය සම්පූර්ණ කර එහි අවසන් වාර්තාව මුදල් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත. මෙම අනවසර හෙළිදරව් කිරීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව තම අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් තවදුරටත් ශක්තිමත් කර ඇති අතර මෙම වාර්තාව අනවසර ලෙස නිකුත්කිරීම සම්බන්ධයෙන් අදාළ නීති බලගැන්වීමේ අධිකාරීන්වලට දැනටමත් පැමිණිලි කොට ඇත.

2016 ඔක්තෝබර් මස 3 වන දින පවත්වන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේදී පීඩාවට පත් බැංකු නොවන මුදල් සමාගම් නඟා සිටුවීම සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ වර්තමාන කාර්යයන් ඇතුළු ප්‍රාථමික වෙළෙඳ ආයතනවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා විශේෂ මුදල් මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට තීරණය කෙරිණි.

මෙම විශේෂ රැස්වීම නොබෝ දිනකින් පැවැත්වීමට නියමිත අතර මුදල් මණ්ඩලය මෙම විශේෂ රැස්වීම පැවැත්වීමට තීරණය කරනු ලැබුවේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ කෙටුම්පත් කරන ලද පරීක්ෂණ වාර්තාව අනවසර ලෙස අනාවරණයවීම පිළිබඳව දැනුවත්වීමට පෙර බව තවදුරටත් දන්වා සිටිමු..